සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 11 /2025

මගේ අංකය: PPSC/ES/14/FI/06/29
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2025. 04 . 29

ලේකම්
පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්
සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණිය සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2025 ජූනි/ජූලි**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු III ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ද මෙය යැවිය යුතු වේ. මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ www.psc.sg.gov.lk හා සබරගමුව පළාත් වෙබ් අඩවියට www.sg.gov.lk යොමු කර ඇත.

02. බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ II,V,VII,VIII,XII,XXVII,XXVIII,XXX, XXXII,XLVII,XLVIII පරිච්ඡේද අදාළ වේ. | පැය 02 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ II පරිච්ඡේදයේ 3 වැනි කොටස (පාඩු හා අත්හැර දැමීම), III පරිච්ඡේදය (මුදල් පාලනය හා ගිණුම්ගත කළ හැකි වීම),IV පරිච්ඡේදය (ලැබීම්), V පරිච්ඡේදය (ගෙවීම්),XIII පරිච්ඡේදය (සැපයුම් වැඩ හා සේවා) අදාළ වේ. | පැය 02 | 100 | 40 |

*සටහන:-* සාමාර්ථය සඳහා එක් විෂයකට 40%කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.

03. විභාගයට අයදුම්කිරීම - අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ ආයතන ප්‍රධානියා /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සබරගමුව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු වේ. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් 2025.05.25 දින හෝ ඊට පෙර සබරගමුව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් මගින් මා වෙත අයදුම්පත් යොමු කල යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් ලිඛිතව මා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

04. මීට පෙර III වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම්කරන්නේ නම් එක් විෂයකට රු.250/=, සමස්ත විභාගයට නම් රු 600/-ක, විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. මාගේ සමාංක හා 2025.03.11 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි 2024.11.23 විභාගයට ඉදිරිපත් වී නොමැති නිලධාරීන් ද නියමිත මුදල් ගෙවිය යුතු ය. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් අයදුම්පත්‍රයේ සඳහන් ලිපිනයට යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

06. තව ද විභාග වංචා සිදු කරන නිලධාරීන්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවීමට කටයුතු කරන අතර, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ බඳවා ගැනීම් පරිපාටියට අනුව ක්‍රීඩා නිලධාරීන් සපුරාගත යුතු සුදුසුකමක් වන බැවින්, විභාගයට මුහුණ දීම වෙනුවෙන් ගමන්වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවීමට හිමිකමක් නොමැත. මේ සම්බන්ධයෙන් ද අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

07. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

අත්සන් කළේ -ඩබ්.ආර්. දිනීශා එස්. රත්නායක

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

<u>පිටපත්</u>

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා
2. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, - සබරගමුව පළාත් සභාව — කාරුණික දැනගැනීම හා අදාළ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා
3. ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කලවාන - කාරුණික දැනගැනීම සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණිය සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2025 ජූනි/ජූලි

01. (a) මුලකුරු සමඟ නම:-
..........................................................................................................(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(b) සම්පූර්ණ නම:-..........................................................................................
..........................................................................................................

(c) මුලකුරු සමඟ නම :-..........................................................................................

(d) රාජකාරී ලිපිනය:-
..........................................................................................................
..........................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(e) ස්ත්‍රී / පුරුෂ භාවය:-..........................................................................

(f) දුරකථන අංකය පෞද්ගලික:- ..........................................................................

(g) දුරකථන අංකය රාජකාරි :- ..........................................................................

(i) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින වාර ගණන-..........................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ඔබ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට පත් වූ දිනය:-..........................................................

05. විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය - සිංහල/දෙමළ

06. පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් :- 01..........................................................
02..........................................................

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටිමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

..........................................................
(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයා ඉදිරිපත් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය/අසත්‍ය බව නිර්දේශ කරමි.(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

දිනය :-

..........................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

අනෙක් පිට බලන්න

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි.
(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න)

..................................................

දිනය :- 2025.

පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
සබරගමුව පළාත් සභාව
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි.
(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න)

..................................................

දිනය :- 2025.

ලේකම්/ලේකම් වෙනුවට
ක්‍රීඩා අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)